මගේ අංකය: ඇල්.ජී.පී/1/93

අධිකරණය විසින් නියම කරනු ලැබ
..ඌව..පළාතේ .1990...අංක..07... දරන
මුදල් ප්‍රඥප්තිය යටතේ අය කරගත් දඩ සහ
දණ්ඩන මුදල් ඌව...පළාතේ පළාත් පාලන
ආයතනවලට පැවරීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ

ප්‍රඥප්තියකි.

....ඌව....පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ ප්‍රඥප්තිය ඌව පළාතේ 1994 අංක ...5... දරන අධිකරණ දඩ පැවරීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

අධිකරණ දඩ සහ දණ්ඩන මුදල් පැවරීම.

2. සංශෝධිත පරිදි වූ ...ඌව....පළාතේ ...1990.... අංක ..07.... දරන මුදල් ප්‍රඥප්තිය අනුව පළාත් සභාව විසින්, පළාතේ පිහිටා ඇති අධිකරණය විසින් නියම කරන ලද දඩ හා දණ්ඩන මුදල් අය කරගෙන ඇති අවස්ථාවක, ඉහත කී පරිදි එම දඩ හෝ දණ්ඩන මුදල් අයකරගත් වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත, අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා විසින් ලිඛිතව පළාතේ මුදල් විෂයය භාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, පළාත් සභාව විසින් එම දඩ හෝ දණ්ඩන මුදල අදාළ පළාත් පාලන ආයතනයට පැවරිය හැකි ය.

අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් සහතිකය.

3. 2 වන වගන්තිය යටතේ වූ කිසිම ඉල්ලීමක් එම දඩ හෝ දණ්ඩන මුදල් ගෙවූ දිනය, එම මුදල් අදාළ අධිකරණය විසින් පළාත් සභාවට ප්‍රේෂණය කළ දිනය සහ එම දඩ හෝ දණ්ඩන මුදල නියම කළේ කවර ආඥාපනත හෝ පනතක් යටතේද යන වග, එකී උපලේඛනයට විශේෂ යොමු කිරීමක් සහිතව, එම දඩ හෝ දණ්ඩන මුදල් නියම කර අයකරගත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් ඒ කාර්යය සඳහා නම් කළ වෙනත් යම් නිලධරයකු විසින්

(6)



සභාපතිය කාර්‍ය ලැබ ඇත්නම් මිස, එවැනි ඉල්ලීමක් වලංගු නොවිය යුතු ය.

අර්ථ නිරූපනය :

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි -

"ප්‍රධාන පරිපාලන නිලධරයා" යන්නේ -

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, මහ නගර කොමසාරිස් වරයා ද ;

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් එහි ලේකම්වරයා ද

අදහස් වෙයි.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද තවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"පළාත" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ...ඌව.....පළාත අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ .ඌව.....පළාතේ පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.